කේ.ඩී. ලාල්කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය,
ගොවිජන මන්දිරය,
රාජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

2026.04.21

ලේකම්,
ජනමාධ්‍ය හා සෞඛ්‍ය අමාත්‍යාංශය,
පොල්හේන්ගොඩ පාර,
කොළඹ 05.

මහත්මයාණෙනි,

<u>හිරු ටීවී රූපවාහිනී නාලිකාවේ ක්‍රියාකලාපය සම්බන්ධ පැමිණිල්ලයි.</u>

1. කේ.ඩී. ලාල්කාන්ත වන මම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස ද, වර්තමාන රජයේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග කැබිනට් අමාත්‍යවරයා ලෙස කටයුතු කරමින් සිටිනෙමි.

2. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් සහ කැබිනට් අමාත්‍යවරයෙක් වන මා විසින් 2024/25 වර්ෂයට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත භාර දී ඇත.

3. එකී වත්කම් හා බැරකම් ප්‍රකාශය, පවුලේ අනෙකුත් පුද්ගලයන්ගේ නම් හෙළි නොවන පරිදි මහජනතාවට දැකගත හැකි ආකාරයෙන් ප්‍රසිද්ධ කිරීමට එම කොමිෂන් සභාව කටයුතු කර තිබේ.

4. මා විසින් ස්වේච්ඡාවෙන් හෙළි කරන ලද මාගේ වත්කම් හා බැරකම් ප්‍රකාශය පදනම් කරගනිමින්, ඒෂියා බ්‍රෝඩ්කාස්ටිං කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ ඇති හිරු ටීවී රූපවාහිනී නාලිකාව විසින් 2026.04.16 වන දින (හෝ ආසන්න දිනක) කරුණු විකෘති කරමින් හා වැරදි ලෙස අර්ථ නිරූපණය කරමින් ප්‍රවෘත්තියක් පළ කරන ලදී.

5. මෙම ප්‍රවෘත්තිය පළ කිරීමට පෙර මාගෙන් කිසිදු ආකාරයක පැහැදිලි කිරීමක් ඉල්ලා සිටීමට එකී රූපවාහිනී නාලිකාව කටයුතු නොකළ අතර, එම සාවද්‍ය සහ ද්වේශ සහගත ප්‍රවෘත්තිය මගින්, මා සතුව රුපියල් කෝටි 46කට අධික වත්කම් පවතින බවට ඔවුන්ගේ ගණනය කිරීමක්

මත පදනම්ව කරුණු පළ කරන ලදී. එකී කරුණු සිරස්තල ලෙස දක්වමින් එම ඊනියා ප්‍රවෘත්තිය සමාජ මාධ්‍ය හා ඩිජිටල් අවකාශයන්හි ප්‍රචාරය කිරීමට ද එම නාලිකාව කටයුතු කර ඇත.

6. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව, වත්කම් හා බැරකම් ප්‍රකාශ කරන පුද්ගලයාගේ නමින් ඇති වත්කම්වලට අමතරව ඔහු සමඟ එකම ගෘහයේ ජීවත් වන බිරිඳගේ සහ අවිවාහක දරුවන්ගේ නමින් පවතින දේපළ ද ප්‍රකාශ කළ යුතු වේ. ඒ අනුව මා විසින් මාගේ බිරිඳගේ සහ දියණියගේ වත්කම් ද එම ප්‍රකාශය මඟින් හෙළි කර ඇත.

7. එහිදී මාගේ දියණිය විසින් සමාගම් කිහිපයක මිලදී ගෙන ඇති, මිල දී ගන්නා අවස්ථාවේ දී රුපියල් 90,000 කට ආසන්න වටිනාකමක් වූ, වර්තමාන වටිනාකම අනුව රුපියල් 143,000 කට ආසන්න වටිනාකමක් ඇති සමාගම් කිහිපයක කොටස් සම්බන්ධයෙන් මා වත්කම් බැරකම් ප්‍රකාශයේ හෙළි කර තිබූ කරුණු හිතාමතාම විකෘති කරමින්, මා රුපියල් කෝටි 38කට ආසන්න සුරකුම්පත් / සමාගම්වල කොටස් මිලදී ගෙන ඇති බවට වාර්තා කිරීමට මෙම මාධ්‍ය නාලිකාව කටයුතු කරන ලදී.

8. මෙම අසත්‍ය ප්‍රවෘත්තිය හේතුවෙන් මාගේ කීර්තිනාමයට විශාල හානියක් සිදු වූ අතර, මා සම්බන්ධයෙන් වැරදි ආකල්පයක් ජනතාව අතර ඇති කිරීමට එකී ප්‍රවෘත්තිය උත්සාහ කරන ලදී. එම වත්කම් බැරකම් ප්‍රකාශයේ මාගේ බිරිඳගේ සහ දියණියගේ නමින් වන දේපළ ද පවතින බව එම ප්‍රවෘත්තියේ කිසිදු තැනක මහජනතාව වෙත අනාවරණය කිරීමට එම නාලිකාව කටයුතු කළේ නැත.

9. ඉහත කී තත්ත්වය තුළ මා හට සිදු වූ අපහාසය සම්බන්ධයෙන් රුපියල් බිලියන 10ක වන්දියක් ගෙවන ලෙස මාගේ නීතිඥවරයා මාර්ගයෙන් එම රූපවාහිනී නාලිකාව වෙත මා එන්තරවාසියක් යොමු කරන ලදී.

10. එකී එන්තරවාසිය යැවීමත් සමඟ, මුල් අවස්ථාවේදී තමන් විසින් පළ කරන ලද ප්‍රවෘත්තිය නිවැරදි කිරීමට තමන්ට අයිතියක් ඇත යන උද්දේශිත පදනමක් මත පිහිටා, වරක් 'කරුණු නිවැරදි කිරීමක්' ලෙස දක්වමින් නැවත ප්‍රවෘත්තියක් පළ කිරීමට මෙම නාලිකාව කටයුතු කර තිබේ.

11. මාගේ උපදෙස් මත මාගේ නීතිඥවරයා විසින් යවන ලද එන්තරවාසියේ අදාළ කොටස්වල හිමිකාරිත්වය මාගේ දියණිය සතු බවට ලිඛිතව දැනුම් දී තිබියදී පවා, ඔවුන් විසින් 2026.04.18 දින (හෝ ආසන්න දිනක) කරුණු නිවැරදි කිරීමක් ලෙස දක්වමින් පළ කළ ප්‍රවෘත්තියේ දී ද අදාළ කොටස් හිමිකම මා සතු බව හුවා දක්වමින්, ඔවුන්ට ගණනය කිරීමේ දෝෂයක් පමණක් සිදු වූ බවත් වටිනාකම වැරදියට ගණනය කිරීම සම්බන්ධයෙන් පමණක් කනගාටුව පළ කර බවත් ප්‍රචාරය කිරීමට මෙම නාලිකාව කටයුතු කරන ලදී.

12. එලෙස මා විසින් ඔවුන් වෙත එන්තරවාසිය යොමු කරන ලද අවස්ථාවේදී, සිවිල් නීතිය යටතේ අපහාසය සම්බන්ධයෙන් ඔවුන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබන්නේ, ඔවුන්ගේ විකාශන බලපත්‍රය සම්බන්ධයෙන් අදාළ නිසි බලධාරීන් වෙත කරුණු ඉදිරිපත් කිරීමට මාහට ඇති අයිතියට අගතියක් නොවන පරිදි  බව විශේෂයෙන් සඳහන් කර සිටියෙමි.

13. මෙහිදී මා ඔබගේ විශේෂ අවධානය යොමු කර සිටින්නේ, රූපවාහිනී නාලිකාවක් යනු මහජනතාව සතු පොදු දේපළක් වන සංඛ්‍යාත භාවිතා කරමින්, ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව මගින් ලබා දෙන ලද බලපත්‍ර මත පදනම්ව සිය කටයුතු කරගෙන යනු ලබන ආයතනයක් බවයි.

14. ඒ අනුව, මහජන දේපළක් වන මෙම සංඛ්‍යාත භාවිතා කිරීමේදී, තමන්ට නිකුත් කර ඇති බලපත්‍රයේ අඩංගු කොන්දේසිවලට අනුකූලව සහ එම කොන්දේසි ප්‍රකාරව වගකීම් සහගත ලෙස සිය මාධ්‍ය භාවිතය සිදු කිරීමට ඕනෑම රූපවාහිනී නාලිකාවක් නීතියෙන් බැඳී සිටින බව වැඩිදුරටත් අවධාරණය කරමි.

15. ඒ අනුව, මා මෙම ලිපිය මගින් ඔබ වෙත පැමිණිලි කර සිටින්නේ, මෙම රූපවාහිනී නාලිකාව මා සම්බන්ධයෙන් ඉහත කී ආකාරයට කටයුතු කර ඇත්තේ අවම මාධ්‍ය සදාචාරයක් හෝ ගරු නොකරමින් සහ ඔවුන් වෙත නිකුත් කර ඇති බලපත්‍රයේ කොන්දේසි මෙන්ම නීතිමය ප්‍රතිපාදන උල්ලංඝනය කරමින් බවයි.

16. එබැවින්, ඔවුන්ට ලබා දී ඇති විකාශන බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කරමින් එකී රූපවාහිනී නාලිකාව මෙලෙස නීති විරෝධී ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් කරනු ලබන මෙම පැමිණිල්ල සලකා බලා, නීතිමය ප්‍රතිපාදන ප්‍රකාරව එම නාලිකාව සම්බන්ධව කටයුතු කිරීමට පියවර ගන්නා ලෙසත් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් මෙරට පුරවැසියකු වශයෙන් ඔබගෙන් ඉල්ලා සිටිමි.

මෙයට,

විශ්වාසී,

.............................................

කේ.ඩී. ලාල්කාන්ත්